

ඇමෙරිකාවේ 'ස්ටැටන් අයිලන්ඩ්' බෞද්ධ විහාරයේ බුද්ධ ප්‍රතිමාවකි.

## ⁘ උඩුපිහිල්ලේ විමලබුද්ධි හිමි

– සී. කේ. අරත්තනගේ

"පූජිත ජීවිත" විශේෂාංගය යටතේ ධර්ම ශාස්ත්‍රීය මෙහෙවරෙහි යෙදෙන දක්ෂ ධර්ම කථිකයකු වූ වියත් හිමි නමක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁘ අභයගිරි ස්තූප මළුව

– නිශාන්ත පීරිස්

අනුරාධපුර පූජා නගරයෙහි පිහිටි අටමස්ථාන නමින් හැඳින්වෙන සුප්‍රසිද්ධ බෞද්ධ සිද්ධස්ථාන අටෙන් එකක් වූ අභයගිරි ස්ථූප මළුවේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක හා ආගමික වටිනාකමක් ඇති අලංකාර – පැරණි ඉදිකිරීම් කිහිපයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁘ ශ්‍රී මහා බෝධි අංකුරයක් කාම්බෝජයට වැඩම කරති

කාම්බෝජයේ සංඝරාජ මහනාහිමියන් ගේ ඉල්ලීමක් අනුව අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස නාහිමියන් විසින් ශ්‍රී මහා බෝධි අංකුරයක් එරටට පරිත්‍යාග කිරීම පිළිබඳ ප්‍රවෘත්ති විශේෂාංගයකි.

## ⁘ පින් කළ නොහැකි නොකල් අටක්

– පොතුහැර විපස්සී හිමි

සත්වයාට කුසලයෙහි යෙදිය නොහැකි අවස්ථා අටක් පිළිබඳ පෙන්වාදීම තුළින් මනුෂ්‍යත්වයේ සහ සද්ධර්ම ශ්‍රවණයේ වටිනාකම පැහැදිලි කර දුන් බුද්ධ දේශනාවකට අර්ථ කථනයකි.

## ⁘ බක් පුර පෝදා සිරිලකට පැමිණි සාමයේ පණිවිඩය

– සිරිපාල මාදුවගේ

බුදුරදුන් විසින් මිණි පළඟක් (මැණික් පුටුවක්) නිසා ඇතිවන්නට ගිය යුද්ධයක් සමථයකට පත් කොට – සිරිලක ඈත අතීතයේ සිටි නාග ගෝත්‍රිකයන් පිරිසකට දහම් අවබෝධ කරවන ලද බව පැවසෙන ඓතිහාසික කතා පුවත පිළිබඳ විමර්ශනයකි.

## ⁘ බුරුම – ශ්‍රී ලංකා ආගමික සබඳතා

බුරුමය හා ශ්‍රී ලංකාව අතර ගොඩනැගුණු බෞද්ධ ආගමික හා සංස්කෘතික සබඳතා පිළිබඳ ඉතිහාසය, දෙරට අතර ආගමික හා සංස්කෘතික වශයෙන් සිදු වූ ගනු – දෙනු හා ඒ තුළින් වර්ධනය වූ ශාසනික කටයුතු.

## ⁘ පරලොව 'නෑදෑයෝ'

(ලේඛක හිමි) කහගල ධම්මරක්ඛිත නා හිමි

බක් පසළොස්වක පෝද ධර්ම දේශනා යටතේ පුද්ගලයාට පරලොව දී උපකාර වන පිනෙහි වටිනාකම මිනිස් ජීවිත කාලය තුළ දී සිදු කරන යහපත් ක්‍රියාවල පාරභෞතික අගය.

## ⁘ සාම පණිවිඩය සිරිලකට ලැබුණු බක් පෝය

– සීසර් සුදුසිංහ

චූලෝදර – මහෝදර යන නා රජුන් දෙදෙනා අතර මිණි පළඟක් පිළිබඳ ඇති වූ සටනක් සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටි දූපතක් වූ නාගදීපයට බුදුරදුන් වැඩම කොට – සාමය උදා කිරීමේ ඓතිහාසික පුවත පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁘ මව්පියන්ගෙන් දූ පුතුනට දිය හැකි උත්තරීතර තෑගි

– එම්. එම්. සිසිර ජයන්ත

මව්පියන් විසින් තමන්ගේ දූ – දරුවන් වෙත ලබා දිය හැකි ඉහළම දායාදය වශයෙන් සැලකිය හැක්කේ – ඔවුන් වෙත මව්පියන් තුළ තිබිය යුතු සෙනෙහස බවයි – මෙම ලිපියේ අදහස. දරුවන් වෙත භෞතික සම්පත් කොතෙක් දයාද කළ ද – දහමට අනුව ඔවුන්ගේ ජීවිත සැබෑ වශයෙන් ගොඩනගන්නේ සෙනෙහස ය යන්නය – ලේඛකයා මෙම ලිපියෙන් පවසන්නේ.

## ⁘ The Buddha and non-violence

*-by Bhikkhu T. Seelananda,* ***Dhamma Advisor, Paramita International Buddhist Centre, No. 7, Kadugannawa***